# සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව
# சமுர்த்தி அபிவிருத்தி திணைக்களம்
# Department of Samurdhi Development

ග්‍රාමීය සංවර්ධන , සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යාංශය
கிராமிய அபிவிருத்தி, சமூகப் பாதுகாப்பு மற்றும் சமூக வலுவூட்டுகை அமைச்சு
Ministry of Rural Development, Social Security and Community Empowerment


මගේ අංකය / எனது இல / My No: DSD/HO/06/EP/01/චක්‍රලේඛ/2025
ඔබේ අංකය / உமது இல / Your No: ..........................................
දිනය / திகதி / Date: 2025.11.26

**සමෘද්ධි චක්‍රලේඛ අංක : 2025/05 ට පස්වන එකතුව**

සියළුම දිස්ත්‍රික් ලේකම්/දිස්ත්‍රික් සමෘද්ධි අතිරේක අධ්‍යක්ෂ ජනරාල්වරුන්,
සියළුම දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂවරුන්,
සියළුම ප්‍රාදේශීය ලේකම්වරුන්
නියෝජ්‍ය/සහකාර අධ්‍යක්ෂවරුන්,
සියළුම සමෘද්ධි කළමනාකරුවන්,
සියළුම සංවර්ධන නිළධාරින්,
සියළුම සමෘද්ධි සංවර්ධන නිළධාරින් වෙත.

**<u>සමෘද්ධි අලෙවි සංවර්ධන වැඩසටහන - 2025</u>**

උක්ත කරුණ සම්බන්ධයෙන් මාගේ සමාංක හා 2025.06.04 දිනැතිව නිකුත් කල සමෘද්ධි චක්‍රලේඛ අංක 2025/5 සහ 2025.07.07, 2025.07.19, 2025.08.12 හා 2025.09.30 යන දිනයන්හි යොමු කරන ලද 2025/5 ට පලමු, දෙවන, තුන්වන හා හතරවන එකතුවන් මගින් ලබාදුන් උපදෙස් වලට අමතර වශයෙනි.

02. අලෙවි සංවර්ධන වැඩසටහන ක්‍රියාත්මක කිරිමේදි සමෘද්ධි චක්‍රලේඛ අංක 2025/05 හි අංක 2 ඡේදය යටතේ අස්වැසුමලාභි,සමෘද්ධි සහනාධාර ලැබූ පවුල්වල තරුණ තරුණියන් වෘත්තීය පුහුණු පාඨමාලා සඳහා යොමු කිරිමේදි එම ආයතනය සහ ප්‍රාදේශීය ලේකම් හෝ බලය පවරන ලද නිළධාරියකු අතර අවබෝධතා ගිවිසුමක් අත්සන් කල යුතුවේ. ඒ අනුව තෘතියික අධ්‍යාපන හා වෘත්තීය පුහුණු කොමිෂන් සභාවේ අනුමැතිය ලත් රාජ්‍ය හෝ පෞද්ගලික අංශයේ වෘත්තීය පුහුණු ආයතනවල පුහුණු පාඨමාලා හැදෑරීමේදි හඳුන්වා දී ඇති අවබෝධතා ගිවිසුමට අනුව ගිවිසුම් ගත වන ලෙස දන්වා ඇත.

03. එහෙත් රාජ්‍ය හා අර්ධ රාජ්‍ය අංශයේ වෘත්තීය පුහුණු ආයතන සමඟ ප්‍රාදේශීය මට්ටමේ අවබෝධතා ගිවිසුම් අත්සන් කිරිමේදි විවිධාකාර ගැටළු හේතුවෙන් ඒවා ප්‍රමාද වන බවට කරුණු අනාවරණය වි ඇත. විශේෂයෙන් එකී ආයතනවල ප්‍රාදේශීය නිළධාරින්ට එම ගිවිසුම් අත්සන් කිරිමට බලයක් නොමැති බවට ඔවුන්ගෙන් විවිධ මැසිවිලි ඉදිරිපත්ව ඇත.

04. එම හේතුව මත ඉදිරියේදි රාජ්‍ය හා අර්ධ රාජ්‍ය අංශයේ ආයතන සමඟ ජාතික මට්ටමේ ගිවිසුම් අත්සන් කිරිමට දැනටමත් කටයුතු ආරම්භ කර ඇති හෙයින් ප්‍රාදේශිය මට්ටමේදී එවැනි ගිවිසුම් අත්සන් කිරීම අත්‍යාවශ්‍ය නොවන බව කාරුණිකව දන්වමි. **එහෙත් සියළුම පෞද්ගලික ආයතන සඳහා අවබෝධතා ගිවිසුම් අත්සන් කිරිම අත්‍යාවශ්‍ය වේ.**

05. මේ වනවිට ඔබ දිස්ත්‍රික්කයේ වෘත්තීය මාර්ගෝපදේශන හා ධාරිතා සංවර්ධන වැඩසටහන් සඳහා ලබාදී ඇති ප්‍රතිපාදන වෘත්තීය පුහුණු වැඩසටහන සඳහා යොදා ගත හැකි බව දන්වන අතර, මෙහිදී ඒ පිළිබඳව අලෙවි සංවර්ධන අංශය වෙත ලිඛිත දැනුවත් කිරිමක් සිදුකිරිම අනිවාර්යය වේ.


1වන අදියර,4 වන මහල , සෙත්සිරිපාය , බත්තරමුල්ල. / 1ம் கட்டம், 4 வது மாடி,செத்சிறிபாய பத்தரமுல்ல / 1st Step, 4 th floor, Sethsiripaya Battaramulla

| | අධ්‍යක්ෂ ජනරාල් / பணிப்பாளர் தலைமையதிபதி / Director General | අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (පාලන හා ආයතන) / மேலதிக பணிப்பாளர் தலைமையதிபதி ( நிர்வாகம்/தாபனம்) / Additional Director General (Admin & Establishment) | ප්‍රධාන ගණකාධිකාරී / பிரதான கணக்காளர் / Chief Accountant | අධ්‍යක්ෂ (ක්ෂුද්‍ර මූල්‍ය) / பணிப்பாளர் (குறு நிதி ) / Director (Micro Finance) | කාර්යාලය / அலுவலகம் / Office |
|---|---|---|---|---|---|
| Tel- | 011-2869824 | 011-2873799 | 011-2869742 | 011-2889003 | 0112872202 |
| Fax - | 011-2889002 | 011-2873996 | 011-2869742 | 011-2887469 | |
| E-mail- | dgsamurdhi@gmail.com | diradmin@samurdhi.gov.lk | finance@samurdhi.gov.lk | | |
| | | **Hot Line :0112-889007** | | **Hot Line:0112-885582** | **Hot Line: 011- 2887722** |

06. රජයේ හා අර්ධ රාජ්‍ය පුහුණු මධ්‍යස්ථාන මගින් පාඨමාලා ආරම්භ කරනු ලබන්නේ වසරකට දෙවරක් පමණි.මේ කරුණ සලකා බලා 2026 වර්ෂයේ ජනවාරි මස දී ආරම්භ කිරිමට නියමිත පාඨමාලා සඳහා පමණක් 2025 වර්ෂයේදි වෘත්තීය පුහුණු වැඩසටහන වෙනුවෙන් ඔබ දිස්ත්‍රික්කය වෙත නිදහස් කරන ලද ප්‍රතිපාදන වැය කළ හැකි බව කාරුණිකව දන්වමි.

07. සමෘද්ධි චක්‍රලේඛ අංක 2025/05 ට අනුව ප්‍රතිපාදන හා අග්‍රිම වැය කළහැකි අවසන් දිනය 2025.11.30 ලෙස සඳහන් කළද, සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ ගිණුම් අංශය මගින් දැනටමත් ලබාදී ඇති උපදෙස් අනුව කටයුතු කරන ලෙස වැඩිදුරටත් දන්වමි.

සි.ඩී.කළුආරච්චි
අධ්‍යක්ෂ ජනරාල්

පිටපත:- 01. ලේකම්,ග්‍රාමීය සංවර්ධන සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යංශය - කා.දැ.ගැ.පි.

02. විගණකාධිපති, විගණකාධිපති දෙපාර්තමේන්තුව - කා.දැ.ගැ.පි.

03. ප්‍රධාන ගණකාධිකාරී, සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව - කා.දැ.ගැ.පි.හා අ.ක.ස.

04. ප්‍රධාන අභ්‍යන්තර විගණක, සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව - කා.දැ.ගැ.පි.

05. සියළුම අංශ ප්‍රධානීන්, සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව - කා.දැ.ගැ.පි.